# සංඛය හා බැඳුණු ශ්‍රී ලංකාවේ ජන වංශය

**තිලංක මනෝජ් සිරිවර්ධන**

කථිකාචාර්ය, පුරාවිද්‍යා හා උරුම කලමනාකරණ අධ්‍යයන අංශය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

thilanka.siriwardana@gmail.com

## හැඳින්වීම

මිනිසුන් විසින් පුලුල් ව භාවිත කරනු ලබන මුහුදු සත්ත්වයන් අතර හක් බෙල්ලා (*Turbinella pyrum*) වඩාත් අවධානයක් දිනා ගනු ලබයි. ශ්‍රී ලංකාවේ සංඛ සංස්කෘතිය සහ සංඛය වෙත භාවිත කරන පුලුල් වදන් මාලාව අනුව එය මෙරට සංස්කෘතියට අවශෝෂණය වී ඇති ප්‍රමාණය පැහැදිලිකර ගත හැකි ය (Siriwardana, 2010., සිරිවර්ධන, 2012). අතීතයේ සිට ම මෙරට මුහුදින් විශාල වශයෙන් හක් බෙල්ලන් අල්ලා ගනු ලැබූ අතර ඒවා වාදනය කරන සංඛ නිපදවීමේ සිට ආභරණ නිර්මාණය දක්වා යොදා ගන්නා ලදී.

## අරමුණ

ශ්‍රී ලංකාවේ සංස්කෘතිය තුළ සංඛයට විශේෂිත ස්ථානයක් හිමිවන අතර ඒ හා බැඳුණු සංස්කෘතිකාංග ඉටුකිරීම සඳහා විවිධ සමාජ ඒකක යොමුවී සිටියහ. මෙම පත්‍රිකාවේ මූලික අරමුණ වනුයේ අතීතයේ සිට ශ්‍රී ලංකාවේ සංස්කෘතිය තුළ සංඛ භාවිතය හා බැඳුණු ජන වර්ග සහ සමාජ ඒකක, ධූර, වෘත්තීන් ආදිය පිලිබඳව සැකෙවින් අධ්‍යයනය කිරීමයි.

## සංඛය සහ ජන වංශය

චිරාගත සම්ප්‍රදාය අනුව සියලු ම මංගල සම්මත ආගමික - සමාජ උත්සව ආරම්භවනුයේ සංඛයෙන් නැගෙනා උතුම් 'ඕම්' නාදයෙනි. යුධ බිමේදී ජය පිළිබඳ හැඟීමක් ජනනය කිරීමට ද එය සමත් ය. ජයග්‍රහණය සහ උතුම් මංගල බව කියාපෑමේ මෙම නාදයෙන් පෘථිවිය සහ දෙව්ලොව දිනන බව ම කියා පානුයෙන් එය නැගීමට උතුම් සංඛයක් ම හැර කිසිවක් සමත් නොවේ. ආසියාතික දේව ගණයා අතර බොහෝ දෙවිවරුන් ස්වකීය හස්තයෙන් සංඛයක් දරා සිටිනුයේ එය සංකේතවත් කිරීමටය.



කියත් භාවිතයෙන් හක් බෙල්ලන් කපන්නෙක් (මූලාශ්‍රය - Kenoyer, Jonathan, 1998 Ancient cities of the Indus valley civilization, Oxford university press, Oxford

ප්‍රාග් සහ මූල ඓතිහාසික අවධිවල මෙරට සංඛය භාවිත කිරීම පිළිබඳව පැහැදිලිව ම ස්ථිර කර නොමැති මුත් යම් සාධක කිහිපයක් හඳුනාගත හැකි ය. අනුරාධපුර සල්ගහවත්ත සහ මාන්තායි කැණිම්වලින් හමුවූ මධ්‍යශිලා යුගයට අයත් සංඛ සාධක හක් බෙල්ලන් ආහාරයට ගැනීමට පිළිබඳව පැහැදිලි කරයි. මූල ඓතිහාසික කොල්ලන්කනත්ත, විල්පත්තු, මාන්තායි ආදී ස්ථානවලින් හමුවූ සාධක හක්බෙලි වලලු නිෂ්පාදනය පිළිබඳව සාධක පවතී.

ක්‍රිස්තුපූර්ව තෙවන සියවසේ දී භාරතයේ අශෝක අධිරාජයා ගොඩනැගූ මහා අධිරාජ්‍යයට ශ්‍රී ලංකාව තම පක්ෂපාතීත්වය පල කල අතර ඔහුගේ ආගමික - දේශපාලනික රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලතාවය දැක්වූ මෙරට පාලකයා මෞර්ය සම්ප්‍රදායේ අභිශේකයක් ලබාගන්නා ලදී. ඒ අනුව දේවානම්පියතිස්ස රජු භාරතය වෙත තම වඩාත් අවනත භාවය පල කරමින් ශ්‍රී මහා බෝධි ශාඛාවක් අනුරාධපුරයේ රෝපනයටත් බුදුදහම උදෙසා පූර්ණ රාජ්‍ය අනුග්‍රහයටත් කටයුතු කලේය. ශ්‍රී මහා බෝධීන්වහන්සේ සමග උන්වහන්සේගේ අවශ්‍ය කටයුතු වෙනුවෙන් එවන ලද කණ්ඩායම ක්‍රමයෙන් මෙරට වඩාත් බලපෑම් කණ්ඩායම් ලෙසින් ඉස්මතු වීමට විය. උක්ත කණ්ඩායමේ සිටි කුලීනයන් පිරිසකට පැවරුණු කටයුත්තක් වශයෙන් හක් ගෙඩි පිඹීම හෙවත් සංඛ වාදනය සඳහන් කෙරෙන අතර (සුලු බෝධිවංශය, 17 කොටස) එයින් පැහැදිලි වන කරුණක් වනුයේ හක් පිඹීම කුලීනයන් ට අයත්ව සිදු කෙරුණු කටයුත්තක් බවයි. එතැන් සිට එම ධුරය ආගමික සහ රාජකීය කටයුතු ආශ්‍රිතව ක්‍රියාත්මක වූවක් බවට පත් විය.

13 සියවසට අයත් කඳවුරු සිරිතේ 'සක්පංච දූරයන්' යනුවෙන් රජු වෙනුවෙන් සේවය කළ නිලධාරියකුගේ තනතුරු නාමයක් දැක්වේ (Herath, 1994, 189). මෙම තනතුරේ මුල් ස්වරූපයක් කල්‍යාණවතී රැජිනගේ (1202 - 1210) රුවන්වැලි සෑ පුවරු ලිපියේ,

*''.........පසකුන් සිත්තරුන් නටන්නන් ගී කියන්නන්, සකුන්දූරයන් පංචයන්......''*

ලෙසින් සඳහන් වේ. මෙම පිරිස රුවන්වැලි ස්තූපයේ සේවය උදෙසා යොදවනු ලැබූ පිරිසකි (Paranavitana, 1943, 255-56, No. 33). මෙයින් හක් පිඹින්නන් පහල සමාජ කුලයකට අයත් බවට අදහසක් පංචතූර්ය වාදනයේ යෙදුණු පංචයන් සමග ඔවුනගේ නම සඳහන්ව තිබීම නිසා ඉදිරිපත් වුවත් (Kulatillake, 2001, 22) පොලොන්නරු යුගයේ අවසාන භාගයේ සිදුවූ කුල සම්මිශ්‍රනය සමග එවැනි ඍජු අදහසකට එලඹීමේ අදහසක් පවතී. එමෙන් ම මහනුවර යුගයේ බෙරවා, ආචාරී ආදි කුල සමාජ ස්ථරායනයේ පහල මට්ටමක ලා සැලකූ ලෙසින් ම පොළොන්නරු යුගයේ ද ක්‍රියාත්මක වූ බව සැලකිය නොහැකි බැවින් සහ දඹදෙණි යුගයේ දී පවා රජුගේ නිලධාරියකු ලෙස සක් පිඹින්නන් ක්‍රියාකළ බැවින් යම් සමාජ පිළිගැනීමක් ඔවුනට වූ බව සැලකිය හැකි ය.

සකුන්දූර යන නාමයේ පසුකාලීන ආකාරයක් වන්නි උපත සහ මලල විත්තිය යන කෘතිවල සඳහන් වේ. මෙම මූලාශ්‍රය දෙක ම පළමුවන බුවනෙකබාහු රජුගේ සමයේ දී භාරතයෙන් මෙරටට සංක්‍රමණය වූ පිරිසක් පිලිබඳව සමාන තොරතුරු ප්‍රමාණයක් ඉදිරිපත් කරයි. එයට අනුව රථාචාරියා, පල්ලංකාර තොටියා, දැලි සමන්තා, මේ වලක්කාරයා, වහුංවලං කර්මාන්තයා, කාලිංගවරයා, සංඛනාදගුරුවා ඇතුලු පිරිසක් මෙසේ පැමිණුනු බව දක්වයි. වන්නි විත්තිය කෘතියේ මෙම නාමය සංඛනාද කරන ගුරුවා ලෙසින් දැක්වේ. මෙම සංඛනාද කරන ගුරුවා යන තනතුරු නාමය වර්තමානය දක්වා ම දේවාල සම්ප්‍රදාය තුල 'පංචදූර' සහ 'සක් පංචදූර' යනුවෙන් පැවතෙන බව හඳුනාගත හැකි ය. සක් පංචදූර යන තනතුර හිමිවනුයේ ඉහල කුලවලට අයත් පුද්ගලයන්ට පමණි (Kulatillake, 2001, 22).

සාමාන්‍ය විහාර සහ දේවාලවල සක් පංචදූර ලෙසින් හැඳින්වුනු සක් පිඹින තනතුර දලදා මාලිගයට පැමිණෙන විට වෙනස් වූ බවක් පෙනී යයි. මහාවංශයේ දැක්වෙන තොරතුරු අනුව ද දළදාවහන්සේට සංඛ නාදයෙන් ගෞරව කිරීම බෙහෙවින් පැරණි පූජා චාරිත්‍රයක් ලෙස හඳුනාගත හැකි ය (මහාවංසය, පරි. 85, 114 ගාථාව., පරි. 89, 46 ගාථාව සහ පරි. 100, 33 ගාථාව). වට්ටෝරු රාළ, ගෙපරාළ, කත්තියන රාළ සහ හක්ගෙඩි රාළ යන නිලධාරීන් හතර දෙනා දළදාවහන්සේ වෙත කරන පුදපූජා

වෙනුවෙන් පත් කෙරුණු ගිහි නිලධාරීන් ලෙස කටයුතු කරති. හක් ගෙඩි මුහන්දිරම් ලෙසින් ද හැඳින්වෙන අවසාන නිලධාරියා සෙස්සන් මෙන් ම ඉහළ කුලයකින් තෝරාගනු ලැබූ හෙයින් ගොවි කුලයට අයත්ව පත්කර ගනු ලැබේ. දෛනික තේවා ආරම්භ වීමට පෙරාතුව පවත්වන හේවිසි වාදනයට ආරාධනා කරමින් දීර්ඝ සංඛ වාදනයක් සිදුකරන අතර තෙවරක් පිඹීමෙන් අනතුරුව බෙර වාදනය ආරම්භ වේ ˜ රාජකාරී ක්‍රමය තුල දී මෙම නිලධාරීන් උදෙසා මහනුවර නිල්ලම්බේ ග්‍රාමයෙන් ප්‍රදානයන් ලබා ඇත. නින්දගම් විස්තර තුල දී ඔවුන් හක්ගෙඩි පංගුකාරයෝ හෝ හක්ගෙඩි පංගුවේ නිලකාරයෝ ලෙසින් සඳහන් වෙති (කුමාරස්වාමි, 1994, 185). සතියට දින තුනක් සහ දිනකට තෙවරක් බැගින් ද සතර මහා උත්සව වල්දී ද පෙරහැර දිනවලදී ද වාදනය කිරීමට රාජකාරිය අනුව බැඳී සිටින ඔවුනට කුඹුරු අක්කරයක්, ගොඩ ඉඩම් අක්කර තුනක් සහ හේන් අක්කර දෙකක් දිවෙල් දීමනා ලෙසින් ප්‍රදානය කර ඇත. රුවන්වැල්ල කඩදොර දේවාලයේ හොරණෑව හෝ හක් ගෙඩිය පිඹින්නා හට නිශ්චිත අස්වනු ප්‍රමාණයක් ගෙවීම් ලෙස ලැබෙන අතර රජුන්ට පවා සේවය කර පරම්පරා භුක්ති ඉඩම් ලද ඔවුන් කපු පවුල්වලට අයත් වෙති (පෞද්ගලික සන්නිවේදනය, පෙරේරා, ශ්‍රීලාල්, 2009).

මේ අනුව හක් ගෙඩි පිඹීම යම් වෘත්තියක් ලෙස ද ඒ අතර ම නිශ්චිත සමාජ පිළිගැනීමක් සහිත ඒකකයක් ලෙස ද ක්‍රියාත්මක වූ බවත් බොහෝවිට උසස් කුලවලට අයත් පිරිස්වලින් තේරී පත්වූ බව ද නිගමනය කළ හැකි ය. හක්ගෙඩිය පිඹීමට අමතරව එය කුල සංකේතයක් ලෙසින් භාවිත කල අවස්ථාව ද දැකිය හැකි ය. 1613 දී පෘතුගීසි ලේඛක බරාදාස් (Barradas) දක්වන ආකාරයට කරාව කුලයේ විවාහ චාරිත්‍රවලදී ඔවුන් ධවල පන්දම, සංඛය සහ සේසත් යන දෑ ස්වකීය සංකේත ලෙස භාවිත කල බවත් ඒවා රජු විසින් ඔවුනට වරයක් ලෙස දුන් බවත් දක්වයි (Pieris, 1992, 145, ft nt. 1). කරාව කුලයේ කොඩියේ සංකේතයක් ලෙසින් ද සංඛය දක්වා ඇත.

හක් බෙල්ලන් ඇල්ලීම තුලදී ද සුවිශේෂී සමාජ නියෝජනයක් සිදුවේ. හක් බෙල්ලන්ගේ කවච සංගීත භාණ්ඩ, ආගමික පුද පූජා, ආභරණ නිෂ්පාදනය, රූපලාවන්‍ය වර්ග නිපදවීම, ආදියට උපයෝගී වූයෙන් විශාල ආර්ථික ලාභයක් සහිතව භාරතයට අපනයනය කළ හැකි විය. එබැවින් යටත් විජිත පාලකයන් එම කර්මාන්තය වෙත ද සුවිශේෂී අවධානය යොමු කරන ලද්දෙන් මුතු කිමිදීමේ නිරත වූ කිමිදුම්කරුවන්ට මුතු කිමිදීමේ සෘතුව අවසාන වූ පසුව ඇති කාලයේ නිරත විය හැකි ධනෝපායන මාර්ගයක් ලෙස පෙන්වාදෙන ලදී. මුතු කිමිදීම උදෙසා පැමිණි භාරතීය දමිල සහ මුහම්මද්වරුන් ශ්‍රී ලංකාවේ පවතින මෙම ජීවනෝපාය ද සැලකිල්ලට ගෙන මෙරටින් කාන්තාවන් විවාහකරගෙන පදිංචිවීම හක්බෙලි කර්මාන්තයේ වර්ධනයට බලපාන ලදී (Hornell, 1914, 39). පසුගිය සියවසේ තෙවන දශකයෙන් අනතුරුව මුතු කර්මාන්තයේ සිදුවූ කඩා වැටීම හේතු කොට ගෙන බොහෝ පිරිසක් වෙනත් වෘත්තීන්ට යොමු වූ අතර හක්බෙල්ලන් ඇල්ලීමේ කර්මාන්තය ක්‍රමයෙන් ප්‍රධාන මට්ටමකට එළඹීමෙන් අනතුරුව නව පිරිස් ඒ වෙත යොමුවනු දැක ගත හැකි ය. මෑතකාලීනව බිහිවූ හක් බෙලි කටු අපනයන සමාගම් යටතේ සේවයට එක්වූ මුස්ලිම්, දෙමල සහ සිංහල ජනයා වාර්ෂික රටාවක් ඔස්සේ රට වටා මුහුදේ හක් බෙල්ලන් ඇල්ලීමේ ද ඒ සමග ම මුහුදු කුඩැල්ලන් රැස් කිරීමේ ද නිරත වෙති. ත්‍රිකුණාමලය, මුතූර්, මඩකලපුව, හම්බන්තොට, මාරි, පානදුර, වෙන්නප්පුව, හලාවත, පුත්තලම, කල්පිටිය, මන්නාරම ආදී ස්ථාන මෙම කර්මාන්තයට ප්‍රසිද්ධියක් උසුලන මධ්‍යස්ථාන වේ. මුතු කර්මාන්තයේ නියැලුණු අවධියේ දී මෙන් මෙතුලදී අනන්‍ය වාර්ගික ලක්ෂණ ගොඩනැගී නොමැති මුත් උප සංස්කෘතික ලක්ෂණ දැකගත හැකි ය. මහා සමාජයෙන් ඔවුන් වඩාත් වෙනස් වන කරුණු වනුයේ ධීවර කර්මාන්තයේදී මෙන් නොව රටවටා යමින් වෘත්තියේ නිරත වීමත්, දියුණු තාක්ෂණික උපක්‍රම භාවිතයත්, සමාජීය වශයෙන් සෙසු පිරිස් සමග පවත්වන සම්බන්ධතා යම් අවම මට්ටමක පැවතීමත් ය.

### ආශ්‍රෙය ග්‍රන්ථ සහ මූලාශ්‍රය

කුමාරස්වාමි, ආනන්ද කේ. 1994, මධ්‍යකාලීන සිංහල කලා, එච්.එම්. සෝමරත්න පරිවර්තනය, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ





සිරිවර්ධන, තිලංක, 2012, ශ්‍රී ලංකාවේ සංඛ සංස්කෘතිය, ප්‍රණාමාඤ්ජලී, සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

Hornell, James, 1914 Sacred chank of India: A monograph of Indian chank (Turbinella pyum), Bulletin No. 07, Madras Fisheries Bureau, Madras

Kulatillake, C. De S., 2001 Musical instruments in Srilanka's history, Department of cultural affairs, Srilanka

Paranavitana, S., 1943 Epigraphia Zeylanica, Vol. IV, Published for government of Ceylon by Oxford university press

Pieris, Paul E., 1992 Ceylon the Portuguese era, volume 01, Tisara publishing Ltd, Dehiwala.

Siriwardana, Thilanka, 2010. Traditional Sri Lankan Terminology in chank (Turbinella pyrum) classification and grading, pp. 287-296, Proceedings of National Archaeological conference, 2010, Part I, Department of archaeology, Sri Lanka.

පෞද්ගලික සන්නිවේදනය

පෙරේරා, ශ්‍රීලාල්, බස්නායක නිලමේ, කඩදොර දේවාලය, කහවත්ත, 2009.04.06